දෙවන පාඩම

එච්. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ. ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර කලාවේ නව සම්ප්‍රදායක් වන වියුක්ත කලා සම්ප්‍රදාය බිහි කිරීමට පුරෝගාමී වූ ශිල්පියා වන එච් ඒ කරුණාරත්න මහතාගේ නිර්මාණවල මධ්‍යගත සංරචනයක් නොමැති අතර තලය පුරා හැඩ තල විසුරුවා හරින සංරචනයක් පෙන්වයි ඔහුගේ නිර්මාණ ආගමික හැඟීම් සහිත වූ ශාන්ත රසයක් ජනිත කරවන බව කලා විචාරක මතයයි මුල් කාලයේ තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වසය මත චිත්‍ර සංරචනය කළ අතර පසුකාලයේ එකිනෙකට වෙනස් මාධ්‍ය භාවිතා කරන ලදී .උදාහරණ වශයෙන් ඇණ ,කාඩ්බෝඩ්, නූල් ,වැනි ද්‍රව්‍ය කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණ අතර සඳ පායා ,චන්ද්‍රකාන්ත පාෂාණය ,මල් සුවඳ ,සුදු වළාකුළු ,මලක සුවඳ ,අස්වැන්න ආදී සිතුවම් ප්‍රධාන වේ . පසු කාලයේ නිර්මාණය කළ" නම් නොකළ "මූර්තිය එකලස් කිරීමේ ශිල්පක්‍රමය අනුව කරන ලද නිර්මාණ යයි ඒ සඳහා තහඩු,කම්බි ,ඇණ ,භාවිතා කර ඇත .මෙහි සනිකවාදය හා එක්කාසු කලාවේ ලක්ෂණ දක්නට ඇත .

01. එච් ඒ කරුණාරත්න ශිල්පියා හඳුන්වා දුන් නව සම්ප්‍රදාය කුමක්ද?

02. සඳ පායා, මලෙක සුවඳ, අස්වැන්න ආදී චිත්‍ර ගණනාවක් නිර්මාණය කළ ශිල්පියා කවුද?

03. එච් ඒ කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණවල.....සහිත වූ ශාන්ත රසයක් ඇති බව කලා විචාරකයින්ගේ මතයයි.

04. මෙම ශිල්පියාගේ " නම් නොකළ" මූර්තිය සඳහා භාවිතා කළ මාධ්‍ය හඳුන්වන්න